**<u>සංචාරක රියදුරු මහතෙකු වශයෙන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ හැඳුනුම්පත් ලබා ගන්නා මා පහත මාර්ගෝපදේශ සහ චර්යාධර්ම සමග එකග වෙමි</u>**

01 අපගේ හැසිරීම සහ සේවා සපයන ආකාරය මත අප රටේ ප්‍රතිරූපය සංචාරකයාට පිලිඹිබු වන බව සැම විටම සිහි තබා ගෙන කටයුතු කිරීමට

02 ප්‍රියකරුව පිරිසිදුව හා චාම් ලෙස සේවා සැපයීමේ දී ගැලපෙන ඇඳුම් ඇඳීමට

03 පෞද්ගලික ස්වාස්ථතාවය පිලිබදව නිතරම සැලකිලිමත්ව කටයුතු කිරීමට ( දත් මැදීම, ස්නානය කිරීම, පිරිසිදුව සිටීම ආදිය)

04 සැමවිටම තම නිහතමානිකම ඇතුථ යහපත් ගුණාංග සමග සේවාව ලබාදීමට

05 හදිසි අවස්ථාවකදී කලබල නොවී සිහිබුද්ධියෙන් හා අද්දැකීම් අනුව කටයුතු කිරීමට මෙන්ම අනවශ්‍ය ලෙස ඔබගේ සේවා දායකයන්ට (සංචාරකයන්ට) ලංවීමට උත්සාහ නොකිරීමට

06 අප රටේ සමාජයේ ගරු කරන හා පිලිපදින නීති රීති, චාරිත්‍ර වාරිත්‍ර හා සම්ප්‍රදායන්ට නිතරම ගරු කිරීමට තම සේවා දායකයනුත් එම නීතිරීති ආදියට ගරු කරනු ලබන බවට වගබලා ගැනීමට

07 ඔබ සමග සිටින සංචාරකයාගේ රට සහ ඔවුන්ගේ ඇදහිලි හා විශ්වාස, චාරිත්‍ර වාරිත්‍ර පිලිබදව වැරදි හෝ විවේචනාත්මක ආකාරයේ ප්‍රකාශ කිරීම්වලින් වැලකීමට

08 තමා සමග චාරිකාවේ යෙදෙන සැම සංචාරකයෙකුටම අඩුවැඩියෙන් හෝ වෙනසක් නොමැතිව එක සේ සැලකීමට

09 සංචාරකයන් සමග තම පෞද්ගලික ප්‍රශ්න, දුක්ගැනවිලි, සැමරුම් දින පිලිබද සාකච්ඡා කිරීමෙන් වැලකීමට

10 ඔබ ලබාදෙන සේවාව තව කෙනෙකුට ආදර්ශමත් වන ලෙස ලබාදීමට කටයුතු කිරීමට

11 සංචාරක කර්මාන්තයේ සාමාජිකයෙකු ලෙස කර්මාන්තයේ රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීමට හා සමාජ මාධ්‍ය ඇතුලු මාධ්‍ය මගින් කර්මාන්තය සහ ආයතන අපහසුතාවයට පත්වන ලෙස කටයුතු නොකිරීමට

12 කිසිදුවිටක තම සංචාරකයන්ගෙන් මුදල් ආධාර ඉල්ලීමෙන් වැලකීමට

13 සැමවිටම සංචාරකයාට තම චාරිකාව හෝ නිවාඩුව මිත්‍රශීලී හා විනෝදජනක ලෙස ගත කිරීමට කටයුතු කිරීමට

14 සැමවිටම පරිසර සංරක්ෂණය පවිත්‍රතාවය සහ සංචාරකයාගේ ආරක්ෂාව පිලිබදව සැලකිලිමත් වීමට

15 සාමාන්‍ය ජීවිතයේදී ඇතැම් අය ඇබ්බැහිවී ඇති (තියපොතු විකීම, ප්‍රසිද්ධියේ උගුර කාරා කෙල ගැසීම, බුලත්විට කෑම, හිස කන් නාසය කැසීම, කෑමෙන් පසුදත් සැරීම, දත් ශුද්ධ කිරීම ආදිය) අයහපත් පුරුදු හැකි තරමින් ඔබේ සංචාරකයන් සමග සිටින අවස්ථාවේ දී වලක්වා ගැනීමට

16 මා අතින් යම් අතපසුවීමක් වූයේ නම්, එය නිහතමානීව පිලිගැනීම හා අසත්‍ය හේතුදීමෙන් එවැනි අතපසුවීම් වසාගැනීමට උත්සාහ නොකිරීමට

17 නියමිත වෙලාවට වැඩ කිරීම ඇතුථ හොද පුරුදු සැමවිටම එකතු කර ගෙන කර්මාන්තයේ අභිවෘද්ධිය උදෙසා සංචාරක සංවර්ධන අධිකාරිය කලින්කලට නිකුත්කර මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීමට

18 සංචාරක රියදුරු කෙනෙකු වන මම මගපෙන්වන්නෙකු නොවන බැවින් මගපෙන්වීම සදහා යොමු නොවීමට

ඉහත මාර්ගෝපදේශයන්ට අනුගතව කටයුතු කිරීමට එකග වෙමි.

නම ....................................................................................................

සංචාරක රියදුරු හැඳුනුම්පත් අංකය ..................................................................

රියදුරු සංගමය ..............................................සාමාජික අංකය ....................

අත්සන ........................................ (රු 400/- ක් ගෙවා ලබා ගතිමි)

දිනය ......................................